**බද්දේගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 17 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දී ලැබී තිබුණු රු.363,096 ක් වූ ගැල්වනයිස් බට 328 හි වටිනාකම සහ සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ හා ට්‍රේලර් 02 හි වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී රු.286,600 කට මිලදී ගෙන තිබුණු ස්ථාවර වත්කම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, වර්ෂය තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි 03 හි වටිනාකම රු.249,012 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.167,556ක ණය වාරිකය සහ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ගෙවිය යුතු රු.6,187,360 ක් වූ දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී කර්මාන්ත ණයගැති ශේෂ 03 ක හා ණයහිමි ශේෂයක එකතුව රු.458,354 ක් වැඩියෙන් ද, තවත් ණයහිමි ශේෂ 02 ක එකතුව රු.197,621 ක් හා උසාවි දඩ ආදායම රු.91,583 ක් අඩුවෙන් ද ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර තිබුණු එකතුව රු.7,196,977 ක් වූ කර්මාන්ත 08 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.15,171,108 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.11,000,132 ක් වූ අසමානතා විය.

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,581,230 ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් නොකර, සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි.

**1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වසර 10 කටත් වැඩි කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.40,282 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් හා එකතුව රු.384,685 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් ද වසර 05 ක් ඉක්ම වූ එකතුව රු.686,497 ක තවත් ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් ද නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.71,456,395 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු සහ අයිතිය තහවුරු කෙරෙන ලියවිලි ද, එකතුව රු.33,141,960 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් පරිදි වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ද, එකතුව රු.25,103,761 ක් වූ ණයගැති සහ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ණයගැති හා ණයහිමි ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම් යනාදිය ද ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(2) | සභාව විසින් අවස්ථා 02 කදී නිලධාරීන්ට ලබා දී තිබූ එකතුව රු.17,850 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | එකතුව රු.2,794,009 ක් වූ තැන්පතු ශේෂ 60 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාවට අයත් වාහන 12 ක් වෙනුවෙන් 2012 ජනවාරි සිට 2015 දෙසැම්බර් මස දක්වා දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්යය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.11,784,647 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,034,220 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,750,427 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ආ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී වැඩසටහන් 04 ක ආදායම් ඉක්ම වූ වියදම් උද්ගත වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.5,682,800 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-------------------------------------

**මුළු ආදායම හා මුළු වියදම අතර අනුපාතය**

-----------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුළු ආදායමින් සියයට 83 ක් තරම් මුළු වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් ආධාර නොලැබෙන්නට ස්වයං උත්පාදිත ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිඳු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බැවින් වියදම් පාලනය කර ගැනීමට මෙන්ම ආදායම් වැඩිකර ගැනීමට සභාවේ දැඩි අවධානය යොමු වියයුතු බව විගණනයේ අදහසයි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

----------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් හා අක්කර බදු, බදු කුලී සහ වෙළඳ බලපත්‍ර වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබුණු රු.44,646,400 ක මුදලින් රු.3,944,862 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 09 ක් තරම් පහළ අගයක් ගෙන තිබුණි.

(ආ) එකතුව රු.9,694,913 ක් වූ සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති වරිපනම් බදු හා අක්කර බදු, බදුකුලී සහ වෙළඳ බලපත්‍ර හිඟ ආදායම් වලින් රු.3,944,862 ක් අය වී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 41 ක් පමණ විය.

### 2.3.2 වරිපනම් බදු හා අක්කර බදු

----------------------------

වරිපනම් බදු අයකර ගැනීම ඉතා පහළ අගයක පැවැතීම නිසා වර්ෂය අවසානයට අයකර ගතයුතු ශේෂය රු.5,173,221 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. කෙසේ වුවද, හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 බදු කුලී

---------

හිඟ බදුකුලී ශේෂ අයකර ගැනීම ඉතා පහළ අගයක පැවැතීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගතයුතු හිඟ මුදල රු.552,081 ක් විය. හිඟ බදුකුලී අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ටෙන්ඩර් තීරණ අභිබවායමින් කඩකුටි වලින් ගාස්තු අයකර තිබූ අතර, බදුකරු නොවන වෙනත් අයෙකු විසින් පොල බදු එකතු කර තිබුණි.

### 2.3.4 කඩ කාමර බදු

---------------

(අ) බද්දේගම නගරයේ පිහිටි කඩ කාමර 14 කින් 2015 දෙසැම්බර් 31 දිනට රු.233,310 ක කඩකුලී අයවිය යුතුව පැවතුණි.

(ආ) ගරා වැටීම නිසා වසාදමා තිබූ කඩ කාමර 03 ක් පරිහරණයට නුසුදුසු බව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,441,220 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.350,958 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට 26 ක් වූ අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5.2 ප්‍රකාරව දේපල ණය වෙනුවෙන්, රජය විසින් දරනු ලබන මුදල සභාවට ප්‍රතිපූර්ණය කලයුතු වුවත්, එම විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2016 ජනවාරි 10 දින වනවිට රු.902,776 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබිය යුතුව තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛණයේ ඇතුළත් වියදම් විෂයයන් 02 ක අනුමත සීමාවන් ඉක්මවා රු.10,707,132 ක වියදම්ද, තවත් වැය විෂයයන් 04 ක එකතුව රු.33,964,451 ක් වූ ඉතිරිකිරීම්ද, ආදායම් විෂයයන් 02 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.36,874,229 ක්ද, පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය